# ඉදිරියට ම යා යුතු මෙහෙයුම්

කොටින්ට එරෙහිව කෙරෙන මෙහෙයුම් ඉදිරියට යන්නේ යම් යම් දේශපාලන හා වෙනත් බාධක ද පරාජය කරමින් බව අප අමතක නොකළ යුතු ය. ප්‍රභාකරන්ගේ මිතුරෝ ද දෙමළ ජාතිවාදයේ මිතුරෝ ද කොළඹ වෙති. ඔවුහු විවිධ උපක්‍රම යොදාගනිමින් මෙහෙයුම් නතර කරවීමට උත්සාහ කරති. හමුදාවන්හි හා පොලීසියෙහි චිත්ත ධෛර්යය හීන කිරීම ඔවුන්ගේ එක් උපක්‍රමයක් වෙයි. එහෙත් රනිල් වික්‍රමසිංහ මහතාට හෝ වෙනත් කිසිවකුට හෝ රණවිරුවන්ගේ චිත්ත ධෛර්යය නැතිකිරීමට හැකි යැයි අපි නො සිතමු. හමුදා මෙහෙයුම් නතර කිරීමට උත්සාහ ගන්නෝ එක්කෝ ප්‍රභාකරන් වෙනුවෙන් නැත්නම් දෙමළ ජාතිවාදය වෙනුවෙන් කඩේ යති. ඔවුහු පරණ කඩවලට මෙන් ම අළුත් කඩවලට ද යති. පරණ කඩේ ගිය ද අළුත් කඩේ ගිය ද ඔවුන්ගේ අරමුණ පැහැදිළි ය. මේ ඇතැම් පරණ කඩවල මෙන් ම අළුත් කඩවල ද මුදලාලිලා සිංහල බෞද්ධ වෙස් ගත්ත ද, හවස් යාමයේ පන්සල් ගිය ද, ඔවුන් සිංහල බෞද්ධ විරෝධී බව ඔවුන්ගේ කියුම් කෙරුම්වලින් පෙනී යයි.

මෙරට යුද්ධයක් නැති බව අපි දිහින් දිගට ම කියා ඇත්තෙමු. ප්‍රවාද අවශ්‍ය නැත, දර්ශනය යනු කොඳු කැඩීමකි, මම සිතමි එබැවින් මම වෙමි යනුවෙන් කී දෙකාර්තේ අනුව යමින්දෝ මම කන්නෙමි එවැවින් යථාර්ථයක් වෙයි යනුවෙන් තර්ක කරන, ඊනියා යුග පුරුෂයන්ට සියුම් සංකල්පීය වෙනස්කම්වල අගයක් නැති නමුත් අපට යුද්ධය ද මෙහෙයුම් ද යන්න වැදගත් වෙයි. එදා මෙන් ම අද ද ඇත්තේ කොටින්ට එරෙහිව කෙරෙන මෙහෙයුම් ය. ඒ මෙහෙයුම් අද මානුෂික මෙහෙයුම් ලෙස හැඳින්වෙයි. එහි වරදක් නැත.

එහෙත් රනිල් වික්‍රමසිංහ මහතාට අනුව මෙරට ඇත්තේ යුද්ධයකි. කිලිනොච්චියට පහර දෙන්නේ යැයි කී හමුදාව මුලතිව් පැත්තට හැරී ඇත්තේ ඇයි දැයි ඔහු අසයි. ඔහු ඒ අසන්නේ හමුදාවට වැරදී ඇත්නම් ඒ නිවැරදි කිරීමට නොව හමුදාවේ නිලධාරීන් හා ආරක්‍ෂක අමාත්‍යාංශය සමච්චලයට ලක්කිරීමටත් සාමාන්‍ය භටයන්ගේ චිත්ත ධෛර්යය දුර්වල කිරීමටත් ය. ඔහුගේ ව්‍යායාමය සාර්ථක වේ යැයි අපි කිසිසේත් නො සිතමු. එහෙත් විපක්‍ෂ නායකයා මෙවැනි අවස්ථාවක ක්‍රියා කළ යුත්තේ මේ ආකාරයට ද? මෙහෙයුම් සාර්ථක කරගැනීම සඳහා ආණ්ඩුවට සහාය දෙනු වෙනුවට විපක්‍ෂයේ බලවත්තු මෙහෙයුම්වලට අකුල් හෙළති. හමුදාව පළමුවෙන් මුලතිව් යෑම පිළිබඳ විරුද්ධවන ප්‍රධාන දෙදෙනෙකු ඇති බව පෙනෙයි. ඒ ප්‍රභාකරන් හා රනිල් ය. මුලතිව් පළමුව නැතිවුවහොත් තමා කිලිනොච්චියේ කොටුවන බව ප්‍රභාකරන් දන්නා බැවින් ප්‍රභාකරන් එයට විරුද්ධ වෙයි. ප්‍රභාකරන් කොටුවීම දෙමළ ජාතිවාදයට ප්‍රශ්නයක් වන බැවින් රනිල් එයට විරුද්ධ වෙයි.

මේ මෑතක් වන තුරුම හමුදා මෙහෙයුම් ජයග්‍රහණයක් කරා මෙහෙයවිය නොහැකි යැයි කීවෝ බහුතරයට අයත් වූහ. අද ඒ ඇතැමුන් හමුදා මෙහෙයුම් දිගින් දිගට ම කළ යුතු යැයි කියන විට අපි සතුටු වෙමු. ඒ අතර ඇතැමුන් එසේ තම මතය වෙනස් කරගෙන ඇත්තේ කපන්න බැරි ඇත සිඹීමට බව ද අපි දනිමු. ඒ ජා පක්‍ෂය අයවැය විවාදයේ දී ආරක්‍ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට පක්‍ෂව ඡන්දය දීම පිළිබඳ ව කුමාර රූපසිංහ කැළඹී ඇති බව ඔහු ලියන කියන දෙයින් පැහැදිළි ය. ඔහුට අනුව එජාපක්‍ෂයේ ඊනියා න්‍යායාචාර්යවරුන් හමුදා මෙහෙයුම්වලින් ජයගැනීමට බැරි බව කියද්දී එජාප මන්ත්‍රීවරුන් ආරක්‍ෂක අමාත්‍යාංශ වැය ශීර්ෂයට පක්‍ෂව ඡන්දය දීම ප්‍රතිපත්ති පීළි පැනීමකි.

එජාපක්‍ෂයට හිතවත් භික්‍ෂුන් වහන්සේ ද වෙති. මේ ඇතැම් භික්‍ෂුන් වහන්සේ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ ආණ්ඩුවෙන් පැකේජය නමින් හඳුන්වනු ලැබූ ඊනියා දේශපාලන විසඳුම ඉදිරිපත් කෙරුණු විට එයට විරුද්ධ වූහ. එහෙත් ඒ විරුද්ධ වූයේ ආණ්ඩුවට මිස ඊනියා දේශපාලන විසඳුමකට නො වේ. සිංහල කොමිසමේ වාර්තාවෙන් කියැවුණු විසඳුම අද අප මතක් කරන්නේ අප එයට විරුද්ධ වූ බව කීමට නොව ඒ විසඳුම ඒකීය විසඳුමක් නොවන බව කීම සඳහා ය. එදා ඒ විසඳුමට පක්‍ෂ වූ භික්‍ෂුන් වහන්සේ අද වැඩ සිටින්නේ කොහේ ද? උන්වහන්සේ සර්ව ආගමික කැරොල් කරත්තයේ නැගී කඩේ වඩින්නේ කා සඳහා ද? ඒ කඩේ පරණ කඩේ ද? නැත්නම් අළුත් කඩේ ද? සර්ව ආගමික කැරොල් කරත්තය හසුරුවනු ලබන්නේ, දක්කනු ලබන්නේ කවුරුන් විසින් ද?

නඩු යන්නෝ වැනසෙන්නෝ යැයි කතාවක් ජනප්‍රවාදයෙහි වෙයි. එහෙත් ඇතැමුන් හා ඇතැම් භික්‍ෂුන් වහන්සේ නඩු යන්නේ කා වැනසීමට ද යන ප්‍රශ්නය නොඅසා ම බැරි ය. හමුදා මෙහෙයුම්වලට විශාල ධනයක් අවශ්‍ය වෙයි. මේ

© Prof. Nalin De Silva

ධනය ආණ්ඩුවේ ආදායමෙන් ගෙවිය යුතු වෙයි. අද බටහිර රටවල් හමුදා මෙහෙයුම්වලට ප්‍රසිද්ධියේ විරුද්ධ නොවන නමුදු, ඇතැම්විට හුදෙක් නාමිකව ත්‍රස්තවාදය පරාජය කළ යුතු බව පවසන නමුදු, ඔවුන්ට අවශ්‍ය වන්නේ ප්‍රභාකරන් හා කොටි පරදිනු දැකීමට නොවන බව අපි දනිමු. බටහිර රටවලින් හමුදා මෙහෙයුම් සඳහා ලැබෙන මුදලක් නැත. හමුදා මෙහෙයුම් සඳහා මුදල් ලබාගත යුතුව තිබෙන්නේ බදුවලින් හා බටහිර නොවන රටවලින් ලැබෙන ආධාරවලින් ය. ඒ වැළැක්වීම සඳහා ඊනියා ජනතාවාදී වෙස්මුහුණක් පැළඳගෙන කෙස් පැළෙන තර්ක ඉදිරිපත් කරන්නෝ වෙත් ද? ඔවුන්ගේ එවැනි වැළැක්වීම්වලින් ජනතාවට ක්ෂණිකව සුළු සහනයක් ලැබිය හැකි නමුදු අවසානයේ දී හමුදා මෙහෙයුම් නතරකිරීමට බල කෙරුණහොත් රටට වන හානිය කෙතෙක් ද? ඉරානයට, චීනයට, තුර්කියට හා වෙනත් බටහිර නොවන රටවලට යෑමට ජනාධිපතිතුමාට සිදු වී ඇත්තේ බටහිරින් මුදල් ලබාගැනීම ඉතා දුෂ්කර නිසා බව පැහැදිළි ය. ඒ අතර යම් හේතුවක් නිසා ආණ්ඩුවේ ආදායම අඩුවුවහොත් කුමක් කරන්නේ ද යන ප්‍රශ්නයට මුහුණ දීමට ආණ්ඩුවට සිදුවනු ඇත. කිසිම හේතුවක් යටතේවත් හමුදා මෙහෙයුම් අත්හැරිය නො හැකි ය. වෙනත් ආදායමක් නැත්නම් ණයට ගෙන, හිඟා කා, හමුදා මෙහෙයුම් ඉදිරියට ගෙන යා යුතු ය. යම් පුද්ගලයකු හෝ පුද්ගලයන් කිහිප දෙනකු එකතු වී හෝ ජනතාවාදී වෙස්මුහුණු මවාගෙන  ආණ්ඩුවේ ආදායම අඩුකිරීමට විවිධ උපක්‍රම අනුගමනය කරන්නේ නම්, විවිධ සටකපට ක්‍රියා කරන්නේ නම්, විවිධ සූත්තර අනුගමනය කරන්නේ නම් ඒ පුද්ගලයා හෝ පුද්ගලයන් හෝ හෙළිදරවු කිරීමට ආණ්ඩුව වග බලාගත යුතු ය.

කිලිනොච්චි හා මුලතිව් මෙහෙයුම් ගැන සුළුවෙන් නො සිතිය යුතු ය. කොටි ඒ තමන්ගේ අන්තිම සටන් බව  දනිති. එහෙත් ඒ දෙමළ ජාතිවාදීන්ගේ අන්තිම සටන නො වේ. කොටි පරදවා තම ඊනියා දේශපාලන විසඳුම ක්‍රියාත්මක කරවීමට බලාපොරොත්තුවන්නෝ වෙති. විවිධ කොටි හා විවිධ දෙමළ ජාතිවාදීහු කොළඹ වෙති. පුවත්පත් කලාවේදියකු ලෙස පෙනී සිටින ඕනෑම අයකු පුවත්පත් කලා වේදියකු පමණක් යැයි සිතීමට අප  ඉක්මන්විය යුතු නො වේ. දෙමළ ජාතිවාදයට පමණක් නොව කොටින්ට ද සේවය කරන ඊනියා ජනමාධ්‍යවේදීහු වෙති. ඔවුන් පරීක්ෂාවට භාජනය කළයුතු බව අමුතුවෙන් කිවයුතු නො වේ. ඊනියා ජනමාධ්‍යවේදි සහතිකය ලබාගත්ත ද උසස් යැයි සම්මත පාසලක ඉගෙන ගත්ත ද වැදගත් යැයි කියන දෙමව්පියන් සිටිය ද කිසිවෙක් අහිංසක නො වෙති.

විශේෂයෙන් ම දෙමළ ජාතිවාදය හා කොටි සම්බන්ධයෙන් ගත්කළ ඉහත සඳහන් ඊනියා සුදුසුකම් ඇත්තන් සිංහල බෞද්ධ විරෝධි වීමට ඉඩකඩ ඇත. ප්‍රභාකරන්ගේ දේශපාලන සීයලා බාප්පලා පමණක් නොව ඇතැම් මස්සිනාලා ද සමාජයේ ඊනියා වැදගත්තු වූහ. අද මේ ඇතැමුන් වෙනුවෙන් පෙනී සිටින්නෝ කවරහු ද? මෙරට දෙමළ ජාතිවාදය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි නිර්මාණයකි. එබැවින් මේ තෝල්කයන් සිංහල බෞද්ධ විරෝධීන් වීම හා ඇතැම් ආගමික ප්‍රධානීන්ගේ ගෝලයන් වීම පුදුමයට කරුණක් නොවිය යුතු ය.

රනිල් වික්‍රමසිංහගේ හෝ ඊනියා ජනමාධ්‍යවේදීන්ගේ (මොවුහු ජඩමාධ්‍යවේදීහු වෙති) හෝ සර්ව ආගමික කැරොල් කරත්ත කරුවන්ගේ හෝ ඊනියා මානව හිමිකම් ආරක්ෂක හොර උපාසක බළලුන්ගේ හෝ අවවාද, තර්ජන, ගර්ජන, උපක්‍රම හා වෙනත් සූත්තර හමුවේ හමුදා මෙහෙයුම් නතරකිරීමට සිදුවුවහොත් අපි නැවතත් අවුරුදු තිහක් ආපස්සට යන්නෙමු. මේ හොර උපාසක බළලුන් පිටුපස බටහිරයෝ වෙති. බටහිරයෝ මොවුන් නඩත්තු කරති. බටහිරයන්ට හෝ ඔවුන්ගේ සුරතල් හොර උපාසක බළලුන්ට හෝ කිසිම ඉඩක් දිය යුතු නො වේ.

ත්‍රස්තවාදීන්ට හෝ ඔවුන්ට ආධාර කරන්නන්ට හෝ මානව අයිතීන් තිබිය යුතු ද? ඔවුහු අහිංසක අසරණ මිනිසුන්ගේ මානව අයිතීන් කැඩුවෝ වෙති. යමකු වැරදිකරුවකු වන තුරු ඔහු නිවැරදිකරුවකු ලෙස සැලකිය යුතු බව සැබෑ ය. එහෙත් සැකකරුවන් පිළිබඳ පරීක්ෂාකිරීමට ද නිසි කලක් ලබාදිය යුතු ය. සැකකරුවා පූර්ණ පරීක්ෂාවකින් තොරව නිදහස්කිරීමෙන් සමාජයට හා මේ අවස්ථාවේ දී එයටත් වඩා ජාතියට හානියක් සිදුවුවහොත් එයට වගකියන්නේ කවු ද? බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ නීතිය සෑම විට ම ක්‍රියා කරන්නේ සිංහල බෞද්ධ අයිතිවාසිකම් වෙනුවෙන් නො වේ. අතීතයේ රෝමයන් යටතේ ද පසුව ඇතැම් ඊනියා දේශප්‍රේමීන් ද අගයන පුනරුදය හා ආලෝකනනය අනුව යමින් අවුරුදු පන්සීයයක් පමණ කාලයක ද වර්ධනය වූ  බටහිර ක්‍රිස්තියානි නීතිය අවසාන විග්‍රහයේ දී බෞද්ධයනට විරුද්ධ වෙයි. ඉංගිරිසින් සිංහල නීතිය අනුව රට කරවීමට වූ පොරොන්දුව කැඩුවේ 1817 දී බව අමතක නො කරමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva